## ජාතිකත්වයට ලැබුණු තුනෙන් දෙක ආණ්ඩුවට අහිමි වූයේ ඇයි?

පසුගිය අටවැනි දා ආරම්භ කරන ලදුව තවමත් කෙළවරක් වී නොමැති පාර්ලිමේන්තු මැතිවරණයෙන් තුනෙන් දෙකක ජයක් ලබාගැනීමට එක්සත් ජනතා නිදහස් සන්ධානයට නොහැකිවන බව හෙළි වී ඇත. ලබන විසිවැනිදා පැවැත්වෙන මැතිවරණයෙන් පසුව එ ජ නි ස අවසාන වශයෙන් ආසන 144ක් පමණ දිනාගනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. එවිට තුනෙන් දෙකක ජයක් සඳහා ආසන 6ක පමණ අඩුවක් වෙයි. ඒ ආසන හයට කුමක් වී ද?

1977න් පසුව ශ්‍රී ල නි පක්ෂය බොහෝ දේ ඉගෙන ඇති නමුත් තවත් බොහෝ දේ ඉගෙනීමට ඇති බව පැහැදිලි ය. ජේ ආර් ජයවර්ධනගේ ගණන් බැලීමට අනුව එ ජා පක්ෂයට 40% ක පමණ ඡන්ද පදනමක් ඇත. එබැවින් සමානුපාතික ඡන්ද ක්‍රමයක් යටතේ දළ වශයෙන් එ ජා පක්ෂයට අවම වශයෙන් ආසන 90ක් පමණ හිමිවිය යුතු ය යන්න ඔහුගේ නිගමනය විය. එතෙක් ශ්‍රී ල නි පක්ෂයට 50% ඉක්මවා යන ඡන්ද ප්‍රමාණයක් ලැබී නොතිබි බැවින් දෙමළ පක්ෂ සමග ඇතිකර ගන්නා විවිධ ගිවිසුම් ඔස්සේ එ ජා පක්ෂයට සැමදාමත් බලයේ සිටිය හැකි යැයි ඔහු කල්පනා කොරන්නට ඇත. එහෙත් ඒ බවක් ඔහු ප්‍රසිද්ධියේ කියා නොමැති බව ඇත්ත ය. ඔහු ඒ පිළිබඳ යමක් කීවේ නම් එ එ ජා ප නැවත අටට නොබසිනු ඇත යන්න පමණ ය.

ශ්‍රී ල නි පක්ෂය ද එදා මේ ලණුව හොදින් ගිල්ලේ ය. සිංහලයන්ගේ ඡන්දවලින් පමණක් බලයට පැමිණිය නොහැකි යැයි බටහිරින් උපදෙස් හා වැටුප් ලබාගන්නා පඬියෝ ශ්‍රී ල නි පක්ෂයට කියා සිටියෝ ය. සිංහලයන් ඇත්තේ 75%ක් පමණක් බැවින් ඔවුන්ගේ ඡන්දවලින් පමණක් බලයට ඒමට නොහැකි බව පඬියෝ ඒකීය ක්‍රමයට ගණන් හදා පෙන්වූහ. ශ්‍රී ල නි පක්ෂය ද මංගල සමරවීර හා තවත් එවැන්නන්ගේ නායකත්වය යටතේ මේ තර්කය පිළිගෙන දෙමළ ජනයාගේ ඊනියා ප්‍රශ්නවලට විසඳුම් ඉදිරිපත් කෙළේ ය. යථා කාලයේ දී බ්‍රිතානීන්ගේ අනුග්‍රහය යටතේ චන්ද්‍රිකා එංගලන්තයෙන් ආනයනය කරනු ලැබීමෙන් පසුව ශ්‍රී ල නි ප තම ජාතිකත්ව ප්‍රතිපත්ති පාවා දී සන්ධීය හා සහසන්ධීය ව්‍යවස්ථා ගැන කතාකරන්නට පටන්ගත්තේ ය. ප්‍රධාන පක්ෂ දෙක ඉන්පසු එකිනෙකා සමග තරග කෙළේ දෙමළ ඡන්ද ලබාගෙන පාර්ලිමේන්තුවේ බලයට පත්වීමට ය. සිංහලයන්ගේ ඡන්දවලින් තුනෙන් දෙකක් පමණ ලබාගැනීමට හැකිනම් බලයට පත්විය හැකි බව අපි කීවෙමු. සාමාන්‍ය තත්වයන් යටතේ සිංහලයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දය එක් පක්ෂයකට ලබාගැනීම අපහසු විය හැකි ය. එහෙත් පඬියන්ට අමතක වූ කරුණ එසේත් නැතහොත් ඔවුන් වුවමනාවෙන් අමතක කළ කරුණ වූයේ දේශපාලනයේ ද අනෙක් ක්ෂේත්‍රවල මෙන් ම විශේෂ අවස්ථා ඇතිවන බව ය. බටහිර ගණිතය හා ගණිතමය භෞතික විද්‍යාව ඉගෙනීමේ එක් වාසියක් ඇත. එහි දී ලැබෙන ශික්ෂණය අනුව විය හැකි මෙන් ම විය නොහැකි යැයි සිතෙන අවස්ථා ද සලකා බැලීමට සිසුහු පුහුණු කෙරෙති. ඒ සෑම අවස්ථාවක් ම උදාවීමට ඉඩකඩ නැතිවිය හැකි ය. එහෙත් විය නොහැකි යැයි සිතෙන අති විශේෂ අවස්ථා වුව ද සලකා බැලීමට සිසුහු ධෛර්යමත් කෙරෙති. එවැනි අවස්ථා ද තිබිය හැකි බවත් ඊනියා ඉන්ද්‍රිය ගෝචර දැනුම එතරම් විශ්වාසයක් තැබිය යුත්තක් නොවන බවත් බටහිර ගණිතඥයෝ හා ගණිතමය භෞතික විද්‍යාඥයෝ දනිති. එසේ නොවී නම් කිසිම දිනක යුක්ලීඩීය නොවන ජ්‍යාමිතියක් හෝ සෘණ ශක්තිය සහිත පොසිට්‍රෝන හෝ නිර්මාණය නොවනු ඇත. අනෙක් අතට අසාමාන්‍ය තත්වයන් යටතේ ඒකීය ක්‍රමය වලංගු නොවන බව ද ගණිතය ඉගෙන ගන්නෝ දනිති. ඕනෑම විධික්‍රමයක්, ප්‍රමේයයක්, ප්‍රවාදයක් වලංගු වන්නේ යම් යම් පරාසයන්හි පමණ ය.

දේශපාලනයෙහි දී ද ඒ එසේම ය. පක්ෂ දෙකක් එකතු වීමෙන් ඇතැම්විට ඒ පක්ෂ දෙක වෙන වෙන ම ලබාගත් ඡන්ද ප්‍රමාණයට වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබාගනු ඇත. එසේත් නැතහොත් අඩු ඡන්ද ප්‍රමාණයක් ලබාගනු ඇත. ඒ අදාළ දේශපාලන තත්ව යටතේ ය. ඒකීය ක්‍රමය එහි දී අදාළ නො වේ. ඒ කෙසේ වෙතත් දැනට බොහෝ කලකට පෙර සිංහලයන්ගේ ඡන්දවලින් පමණක් වුවත් බලයට පත්විය හැකි බව අපි කියා සිටියෙමු. ඒ විශේෂිත තත්වයක් යටතේ බව පැහැදිලි ය. එහෙත් ඒ සඳහා ඉඩකඩක් ඇති බවත් දෙමළ ඡන්ද දිනාගැනීම සඳහා ශ්‍රී ල නි පක්ෂය තම ජාතිකත්ව ප්‍රතිපත්ති අත්නොහළ යුතු බවත් එක් ප්‍රතිපත්තියක් මත සිටීමේ ප්‍රතිඵලයක් ලෙස සිංහලයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයක් ලබාගැනීමේ අපහසුතාවක් නැති බවත් අපි කියා සිටියෙමු. එහෙත් චන්ද්‍රිකා යටතේ ශ්‍රී ල නි පක්ෂයේ ලකුණ බිහිරි අලියා විය. අපේ මත ජාතිකත්වයට බිහිරි වූ අලින්ට වීණා ගායනා කිරීමක් විය. එහෙත් අපි පසුබට නොවීමු. අපට වාදනය කරන්නට තිබුණේ ජාතිකත්ව වීණාව ය. අපි දිගට ම ඒ වාදනය කෙළෙමු. ඒ වන විට

© Prof. Nalin De Silva

ජාතිකත්වයට බිහිරි වී සිටි අලියාට නොඇසුණු ජාතිකත්ව වීණාව එ ජා ප අලියාට තවත් කාලයකට නොඇසෙන බව අපි දැන සිටියෙමු. ඌ ජන්මයෙන් ම ජාතිකත්ව භාණ්ඩවලට බිහිරි ය. ඌට ඇසෙන්නේ පියානෝව හා ඩ්‍රම්ස් ය.

එහෙත් අපට වුවත් එකල ශ්‍රී ල නි ප ප්‍රමුඛ සංධානයකට තුනෙන් දෙකක ඡන්දයක් ලැබේ යැයි නොසිතිණි. ඒ සඳහා අතිශයින් ම විශේෂිත දේශපාලන තත්වයක් අවශ්‍ය විය. ඒ තත්වය පසුගිය මැයි දහඅටවැනි දා උදා විය. ඉන්පසු සිංහල ඡන්දවලින් පමණක් වුවත් තුනෙන් දෙකක ජයක් ලැබීමට ඉඩ ඇති බව අපි කියා සිටියෙමු. පසුගිය පළාත් සභා ඡන්දවලදී ඒ බව ප්‍රත්‍යක්‍ෂ විය. දෙමළ සහ මුස්ලිම් ජනයා ද යම් ප්‍රමාණයකට සන්ධානයට ඡන්දය දීමේ ප්‍රවණතාවක් ඇති බැවින් පාර්ලිමේන්තුවේ ද තුනෙන් දෙකක ජයක් ලැබීමට ඉඩකඩ ඇති බව අපි කීවෙමු. චන්ද්‍රිකාගේ බිහිරි අලි මෙන් නොව මෙදා ඇතැම් මැති ඇමතිවරු අප්‍රියෙල් මැතිවරණයේ දී වේදිකාවෙන් තුනෙන් දෙකක ජයක් ගැන කතාකළහ. මහින්ද රාජපක්‍ෂ මහතාගේ ඒකායන ප්‍රතිපත්ති, විදේශිකයන් හමුවේ දණ නොනැමීම හා අවසානයේ දී පඬියන් විසින් අනභිබවනීය යැයි හඳුන්වනු ලැබූ කොටි පරාදකිරීම හමුවේ ජාතිකත්ව බලවේග සියල්ල පාහේ ඒකරාශී වී සිටියේ ය. එහෙත් ඒ සියල්ල පාහේ මිස සියල්ල නො වී ය. කොළඹ හා කොළඹ අවට කෝට්ටේ, කඩුවෙල, මහරගම, කැස්බෑව, දෙහිවල ආදී ඡන්ද කොට්ඨාශවල හා ගාල්ල වැනි නගරවල මෑතක සිට මහප්පරාණ නාගරික ජාතිකත්වයක් ඇති ජනගහණයක් බිහි වී ඇත. මොවුන්ගෙන් ඇතැම් අයෙක් එ ජා පක්‍ෂයට ඡන්දය දුන් එහෙත් ජාතිකත්ව මත දැරූවෝ වෙති. ඔවුන්ට වර්තමාන එ ජා ප විජාතික නායකත්වය දරාගත නො හැකි ය. ඒ අතර ඔවුහු විවිධ හේතු නිසා ශ්‍රී ල නි පක්‍ෂය ප්‍රධාන සංධානයට ඡන්දය දීමට මැළිකමක් දක්වති. එහෙත් මේ අයගේ ඡන්දය එ ජ නි සන්ධානයට ලබාගත හැකි ය. අවශ්‍ය වන්නේ ප්‍රශ්න හඳුනාගෙන නිවැරදි ව පිළිතුරු ඉදිරිපත් කිරීම ය. මහප්පරාණ වුවත් ඔවුහු ද ජාතිකත්වයට පක්‍ෂපාතී වෙති. මොවුන්ගෙන් ඇතැමෙක් සෝම හාමුදුරුවන් සමඟ ආධ්‍යාත්මික ව බැඳී පසුව හෙළ උරුමයට ඡන්දය දුන්හ. අද මහප්පරාණ ජාතිකත්ව පක්‍ෂපාතී නාගරික පිරිසෙන් බොහෝ දෙනෙක් සරත් ෆොන්සේකා සමග බැඳී ජ වි පෙ පිහිටුවාගත් හවුළට ඡන්දය දෙති. එදා හෙළ උරුමයට ඡන්දය දුන් සියල්ලන් ම අද ජ වි පෙ හවුළට ඡන්දය දෙන බව මෙයින් නො හැඟෙයි. එහෙත් ඒ කොටස් දෙකට ම පොදු පිරිසක් ඇති බව ද පැහැදිලි ය. එදා හෙළ උරුමයට වැඩිපුර ඡන්ද ලැබුණේ ද ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසවලින් ය.

ජ වි පෙ - සරත් ෆොන්සේකා හවුළට වැඩිපුර ලැබී ඇත්තේ මේ මහප්පරාණ නාගරික ජාතිකත්ව ඡන්ද බව ද පැහැදිලි ය. තම බලකොටුව වූ හම්බන්තොටින් ජ වි පෙට 1994 සිට රැකගත් මන්ත්‍රී ධුරය අහිමි වෙද්දී ඉහත සඳහන් නාගරික ඡන්ද කොට්ඨාසවලින් ඡන්ද ලැබී ඇත්තේ සරත් ෆොන්සේකා මහප්පරාණ නාගරික ජාතිකත්ව ඡන්ද ආකර්ෂණය කිරීමට සමත් වී ඇති බැවිනි. ජ වි පෙ මන්ත්‍රී ආසන කිහිපයක් ලබාගෙන ඇත්තේ මේ මහප්පරාණ නාගරික ජාතිකත්වයට සරත් ෆොන්සේකා විකිණීමෙනි. එදා හෙළ උරුමය ආසන කිහිපයක් ලබාගත්තේ මේ ඇතැමුනට සෝම හාමුදුරුවන් විකිණීමෙනි. මොවුන් පිරිසකට අනුව කොටි පරාජය කිරීමේ නායකත්වය මෙන් ම ගෞරවය ද සරත් ෆොන්සේකාට හිමිවිය යුතු ය. ඔවුන්ට අනුව සරත් ෆොන්සේකා හමුදා පොලිසියෙන් අත් අඩංගුවට ගැනීමත් හමුදා අධිකරණ දෙකක් ඉදිරියට පැමිණවීමත් වැරදි ය. මේ මහප්පරාණ නාගරික ජාතිකත්වයේ ඡන්ද ලැබුනේ සරත් ෆොන්සේකාට මිස ජ වි පෙට නො වේ. එ ජ නි සංධානයේ මැතිවරණ උපදේශකයන් ඒ බව කලින් ම වටහා ගත්තේ නම් කළ යුතුව තිබුණේ සරත් ෆොන්සේකාගේ ජාතිද්‍රෝහී පාවාදීම ගැන, ඔහු තම ජීවිතය බේරාගැනීම සඳහා ජනාධිපතිතුමා හා ආරක්‍ෂක ලේකම්තුමා බටහිරයන්ට පාවාදීමට කටයුතු කිරීම ගැන මහප්පරාණ නාගරික ජාතිකත්වයට පැහැදිලි කිරීම ය. රජයේ රූපවාහිනී හසුරවන්නන්ට අපි ඒ බව කීවෙමු. එහෙත් ඔවුන්ට ඒ තේරුම් ගැනීමට අවශ්‍යතාවක් නො වී ය. එ ජ නි ස මැතිවරණය දිනන බව දත් ඔවුන්ට අවශ්‍ය වූයේ ලකුණු දාගැනීමට වැඩ සටහන් නිෂ්පාදනය කිරීම පමණ ය. ඔවුහු ජ වි පෙ නිසා විශ්වවිද්‍යාල අඩපණ වන ආකාරය කීමට උගතුන් කැඳවූහ. එහෙත් එයින් කිසිදු ඵලක් වූයේ නැත. ජනතාව ජ වි පෙ ගැන ඒ වන විටත් කළකිරී සිටියෝ ය. අවශ්‍ය වූයේ සරත් ෆොන්සේකා කවුදැයි හෙළිදරවු කිරීම ය. පඬියන් නො කෙළේ ද එයම ය. එහි ප්‍රතිඵලය වූයේ තුනෙන් දෙකට අඩු වන ආසන හය සරත් ෆොන්සේකා මගින් ජ වි පෙට ලැබීමට සැලැස්වීම ය. මහප්පරාණ වුවත් නැතත් මේ සියල්ල ජාතිකත්වයේ ඡන්ද වේ. ජාතිකත්වයට තුනෙන් දෙකක් ලැබී ඇත. එහෙත් ජාතිකත්වයක් ගැන නොසිතන තම මඩිය තරකර ගැනීමට පමණක් ජාතිකත්වය ගසාකන පඬියන් නිසා එ ජ නි සංධානයට තුනෙන් දෙක අහිමි වී ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva